# ශ්‍රී ලංකා දුම්රිය ස්ථානාධිපති සංගමය
இலங்கை புகையிரத நிலைய அதிபர் சங்கம்
Established 1923
Sri Lanka Railway Station Masters' Association
Reg. No: 294

ගරු සභාපති සුමේධ සෝමරත්න
Hon. President Sumedha Somarathna

ගරු ලේකම් කසුන් චාමර ජයසේකර
Hon. Secretary Kasun Chamara Jayasekara

ගරු භාණ්ඩාගාරික කේ. සතිස්කුමාර්
Hon. Treasurer K. Sathiskumar


මගේ අංකය: දු.ස්ථා.සං./ජනාධිපති/2026/02

2026.03.17

අතිගරු ජනාධිපතිතුමා
ජනාධිපති කාර්යාලය
කොළඹ 01.

**ඉන්ධන අර්බුධ තත්ත්වය හමුවේ දුම්රිය ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම සම්බන්ධවයි.**

වර්තමානයේ මැදපෙරදිග කලාපයේ පවතින භූ-දේශපාලනික අර්බුධ සහ යුධමය තත්ත්වයන් හේතුවෙන් ගෝලීය ඉන්ධන මිල ඉහළ යාම, සැපයුම් මාර්ගවලට බාධා ඇතිවීම සහ ඉන්ධන සපයන රටවල් අතර ඇතිවිය හැකි අස්ථාවරතාවයන් නිසා ශ්‍රී ලංකාව තුළ ඉන්ධන සීමාකාරී තත්ත්වයක් ඇතිවිය හැකි බව පැහැදිලිව පෙනී යයි.

මෙම තත්ත්වය පිළිබඳව පෙරදැක්මකින් යුතුව, දුම්රිය ස්ථානාධිපති සංගමය විසින් 2026.03.04 දිනැති ලිපිය මගින් දුම්රිය දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති අතර, එමගින් ඉදිරියේදී ඇතිවිය හැකි ප්‍රවාහන අභියෝග පිළිබඳව කලින් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව අවධාරණය කරන ලදී. ඒ අනුව, මෙම තත්ත්වය පිළිබඳව දුම්රිය ස්ථානාධිපති සංගමය විසින් කලින් අවධානය යොමු කර ඇති බව ද දන්වා සිටිමු.

ඉන්ධන සීමාකාරී තත්ත්වයක් ඇතිවීමත් සමඟ, පෞද්ගලික වාහන භාවිතය සීමා වී, කාර්යාලීය කාර්ය මණ්ඩලය, පාසල් සිසුන් සහ දෛනික ගමනාගමනය සිදුකරන මහජනතාව පොදු ප්‍රවාහන සේවාවන් වෙත වැඩි වශයෙන් යොමු වීම අනිවාර්යයෙන් සිදුවිය හැකි තත්ත්වයක් බව පැහැදිලිය. විශේෂයෙන්ම නාගරික හා තදාසන්න ප්‍රදේශවල, දෛනික ගමනාගමන අවශ්‍යතා ඉහළ යාමත් සමඟ, පවතින පොදු ප්‍රවාහන පද්ධති මත ඇති වන පීඩනය වැඩි වශයෙන් ඉහළ යා හැකි බවද අපේක්ෂා කළ හැක.

මෙවැනි තත්ත්වයකදී, වැඩි ධාරිතාවයකින් යුත්, විශ්වාසනීය සහ පිරිවැය අඩු ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය සේවාව ප්‍රධාන භූමිකාවක් ඉටු කළ යුතු අතර, එය රටේ දෛනික ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය යටිතල පහසුකමක් බවද සැලකිය යුතුය. එබැවින්, ඉහළ යා හැකි මගී ඉල්ලුම සහ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා දුම්රිය සේවාව කඩිනමින් පුළුල් කර ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය කාර්යයක් වන අතර, එම කාර්යයන් ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීම අවශ්‍ය බව ඔබ වෙත කාරුණිකව දන්වා සිටින්නෙමු.

ඒ අනුව, පවතින තත්ත්වය සැලකිල්ලට ගනිමින් පහත ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය බව අපගේ සංගමය විසින් යෝජනා කරනු ලැබේ:

1. දුම්රිය ධාරිතාව වැඩි කිරීම හා සේවා පුළුල් කිරීම

- කාර්යාල දුම්රිය සඳහා අමතර මැදිරි එක් කිරීම.
- single set ලෙස ධාවනය වන කාර්යාල දුම්රිය double set ලෙස ධාවනය කිරීම.

2. මගී ආකර්ෂණය හා සේවා ගුණාත්මකභාවය වැඩි කිරීම

- වායු සමනය කල (AC) මැදිරි සහිත කාර්යාල දුම්රිය ධාවනය.

3. Park & Ride සහ ප්‍රවේශ පහසුකම වැඩි කිරීම

- දුම්රිය ස්ථානවල පවතින වාහන නවතා තැබීමේ පහසුකම් උපයෝගී කරගනිමින් පෞද්ගලික වාහන මගින් පැමිණ දුම්රිය භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- තදාසන්න ප්‍රදේශවල සිට දුම්රිය ස්ථාන වෙත ප්‍රවේශ වීම සඳහා බස් රථ මගින් පහසුකම් ලබා දීම.


377/26, දුම්රිය පටුමඟ, කොළඹ 10.
377/26, Railway Avenue, Colombo 10.
Tel / Fax : 011 2665957 | E-mail : smunionsslr@gmail.com | Web : www.stationmasters.lk

4. ඉලක්කගත නාගරික ප්‍රවාහන සැලසුම්

- මීරිගම, පාදුක්ක, පානදුර, කළුතර, මීගමුව වැනි ප්‍රදේශවල සිට කොළඹ නගරයට අමතර දුම්රිය සේවා ක්‍රියාත්මක කිරීම.
- කොළඹ නගරයට පෞද්ගලික වාහන ඇතුල්වීම අඩු කිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය.

5. මෙහෙයුම් සහ නඩත්තු

- දුම්රිය එන්ජින්, මැදිරි සහ බලවේග කට්ටල කඩිනමින් අලුත්වැඩියා කර සේවයට යොදවීම.
- අලුත්වැඩියා සඳහා අවශ්‍ය අමතර කොටස් සහ ඉන්ධන ලබාගැනීම සඳහා ප්‍රමුඛතා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

මෙම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මගින්, පෞද්ගලික වාහන භාවිතය අඩු කර ඉන්ධන භාවිතය සීමා කිරීමත් සමඟ, නාගරික රථවාහන තදබදය අවම කරගැනීමටද, රාජ්‍ය ආදායමට ද සෘජුව ධනාත්මක බලපෑමක් ඇති කිරීමටද හැකි වනු ඇත.

එබැවින්, ඉහත කරුණු සලකා බලමින්, ඉන්ධන අර්බුධ තත්ත්වයට මුහුණ දීම සඳහා දුම්රිය සේවාවන් කඩිනමින් සංවිධානය කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් අදාළ අංශ වෙත නිකුත් කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා දුම්රිය ස්ථානාධිපති සංගමය

ආර්.එම්.එස්.කේ.සී. ජයසේකර
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා දුම්රිය ස්ථානාධිපති සංගමය.
076 0980 661